## පළමුවන කියැවීම

ඉසයියස් 62:11-12

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**අන්න, නුඹේ ගැළවුම්කාරයාණෝ උපන්නා හ.**

සමිඳුන් පොළොවේ සීමා දක්වා මෙසේ ප්‍රකාශ කර ඇත. "අන්න, නුඹේ ගැළවුම්කාරයාණෝ, එතුමාණෝ විපාක දෙන සේක. දිනාගත් දීමනාව ගෙනෙන සේකැ යි ජෙරුසෙලෙම් වැසියන්ට ප්‍රකාශ කරන්න. නුඹලා, 'ශුද්ධ සෙනග' කියාත්, 'සමිඳුන්ගේ මුදගත් ජනතාව' කියාත් කියනු ලබන්නහු ය. ජෙරුසලම 'දෙවිඳුන්ගේ තෝරාගත් නගරය' කියාත් කියනු ලබන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 97:1, 6, 11, 12

පිළිතුර: අද දින පොළොවෙ මත නව ආලෝකයක් බබළන්නේ ය.

ගීය: සමිඳාණෝ රජකම් කරන සේක. මිහිතලය ප්‍රීති වේවා! දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේවා!

දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ කරන්නේ ය. සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය නරඹන්නෝ ය. දැහැමියන් මත එළිය බබළයි. යහපත් අය මත සතුට දිළිසෙයි.

පින්වත්නි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙත්වා! එතුමන්ගේ සුවිශුද්ධ භාවය සිහි කොට එතුමන්ට ප්‍රශංසා කරත්වා!

## දෙවන කියැවීම

තීතස් 3:4-7

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් තීතස්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**ස්වකීය දයානුකම්පාව නිසාම උන් වහන්සේ අප ගැළෙවූ සේක.**

එහෙත් අපගේ ගැළවුම්කාර දෙවියන් වහන්සේගේ ගුණවත්කම හා ප්‍රේමය මනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ වූ කල, අප විසින් ම කළ දැහැමි ක්‍රියාවලින් නොව, හුදෙක් ස්වකීය දයාව ලෙස පුනරුත්පාදනය නැමැති ධෝවනයෙන් ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ අළුත් කිරීමෙන් ද උන් වහන්සේ අප ගැළෙවූ සේක. උන් වහන්සේගේ වරප්‍රසාදයෙන් අප ධර්මිෂ්ඨ කරනු ලැබ සදතන ජීවනයේ බලාපොරොත්තුවට උරුමක්කාරයන් වන පිණිස, උන් වහන්සේ අප ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන ශුද්ධාත්මයාණන් අධික ලෙස අප පිට වැගිරෙව් සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ලූක් 2:14

ආලේලූයා! ආලේලූයා!
'අති උසස් තැන්හී දෙවිඳුන්ට මහිමය ද
මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා!
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 2:15-20

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**එඬේරු මරිය තුමිය ද, ජෝසෙප් ද, ගව ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝය.**

තවද, දේව දූතයන් ඔවුන් කෙරෙන් සගලොවට ගිය කල, එඬේරු "අපි වහාම බෙත්ලෙහෙමට ගොස් ස්වාමින් වහන්සේ අපට දන්වා වදාළ මේ සිද්ධිය බලමු" යි ඔවුනොවුන් අතර කතා කර ගත්හ. ඔව්හු යුහුව ගොස් මරිය තුමිය ද, ජෝසෙප් ද, ගව ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝය. ඔවූහු ඒ දැක මේ දරුවා ගැන තමන්ට දන්වන ලද දේ පළ කළහ. ඒ ඇසූ සියල්ලෝ, එඬේරුන් පැවසූ සියල්ල ගැන මවිත වූහ. එහෙත් මරියතුමී එකී සියල්ල සිත්හි නිදන් කොට ඒවා මෙනෙහි කළාය. එඬේරුද තමන්ට දන්වන ලද ලෙසම ඇසූ දුටු සියල්ල ගැන දෙවියන් වහන්සේට ගෞරව කරමින්ද ප්‍රශංසා කරමින්ද පෙරළා ගියහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.